පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 117 / 2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திகதி / Date — 22/01/2024 පැය 1610

# මාධ්‍ය නිවේදනය

## පුවතක් සම්බන්ධව පැහැදිලි කිරීම - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.

**"පොලිස්පති තුමා සීඅයිඩීයට කඩා පනී. සීඅයිඩී විමර්ශන සම්බන්ධයෙන් දොස් තබයි."** යනුවෙන් 2024.01.05 වන දින ඔබ පුවත්පතේ පල වූ පුවතක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් මා වෙත කරුණු පැහැදිලි කර ලිපියක් යොමු කර ඇත.

එහි සඳහන් පරිදි 2024.01.04 වන දින වැඩබලන පොලිස්පතිතුමාගේ ප්‍රධානත්වයෙන් නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත් උතුර සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පවත්වා ඇත. එහිදී දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රැඳවුම් නියෝග මත සිටින වික්‍රමරත්න නදුන් චින්තක නොහොත් හරක් කටා, සෙල්ලපෙරුමගේ සළිඳු මල්ෂිත ගුණරත්න නොහොත් කුඩු සළිඳු සහ බස්නාහිර පළාත උතුර දිසා අපරාධ කොට්ඨාසය භාරයේ රැඳවුම් නියෝග මත සිටින සංජීව කුමාර සමරරත්න නොහොත් ගණේමුල්ල සංජීව යන සැකකරුවන්ට අදාලව මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවතින විමර්ශනවල ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් සිදු කල බවට වැඩිදුරටත් දැනුම් දී ඇත.

මෙම සාකච්ඡාව අතරතුර වැඩබලන පොලිස්පතිතුමා විසින් මත්ද්‍රව්‍ය නාශක දිශාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා කැඳවා ඉහත සැකකරුවන් සම්බන්ධව නිලධාරීන් කණ්ඩායම් 03 ක් පත් කර තවදුරටත් විමර්ශන සිදු කරන ලෙස ඒ මහතා වෙත උපදෙස් ලබා දී ඇත.

කරුණු එසේ හෙයින් ඉහත සිරස්තලය යටතේ ඔබ පුවත්පතේ පලවූ පුවත නිවැරදි පුවතක් නොවන බැවින් එම පුවත මඟින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කීර්ති නාමයට බලවත් අගතියක් සිදු වන බවත් , මේ සම්බන්ධව පලවූ වැරදි පුවත නිවැරදි කර නැවත ඔබ පුවත්පතේ පලකර දෙන ලෙස මා වෙතින් ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව මෙම නිවැරදි පුවත සම්බන්ධයෙන් පෙර පුවතට ලබා දුන් ප්‍රමුඛතාවයම ලබා දෙමින් පල කර දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.